
# උන්වහන්සේගෙන් කමටහනක්...



# උන්වහන්සේගෙන් කමටහනක්

# පිදුම

නිවන් දකිමු youtube නාලිකාව ඔස්සේ උන්වහන්සේ විසින් දේශනා කරන ලද දීර්ඝ දේශනා මා අසන්නට පටන්ගත්තේ මීට වසර කිහිපයකට පෙරයි. මා හිතන විදිහ උඩුයටිකුරු කරන්න සමත් වූ මේ වටිනා දේශනා ධර්ම දානයක් ලෙස මුළු ලෝකයටම ලැබෙන්නට සැලැස්විය යුතුයි කියන අදිෂ්ඨානයේ ප්‍රතිඵලයක් වශයෙන් මේ දේශනා තුළින් උපුටාගත් කෙටි කමටහන් කිහිපයක් පොතක් ලෙස මුද්‍රණය කොට නොමිලේ ලබාදෙමි. තථාගතයන් වහන්සේ දේශනා කළ ලෝක යථාර්ථය ප්‍රායෝගික ලෙස කියාදෙමින් ලෝක සත්ත්වයා හට උතුම් නිවනේ මග පෙන්වන නිවන් දකිමු අරණ්‍ය සේනාසනයේ ආචාර්යයන් වහන්සේට මාගේ නමස්කාරය වේවා! මේ පොතේ පිටකවරය නිර්මාණය කිරීමේ සිට නන් අයුරින් මාව දිරිමත් කොට අවවාද අනුශාසනා ලබාදුන් ධම්ම විතසෝක පොඩි හාමුදුරුවන්ටත් මගේ නමස්කාරය වේවා !

ආර්ය මාර්ගයේ ගමන් කරමින් සසරින් එතෙර වෙන්න වෙරදරන සියලුම ආර්ය ශ්‍රාවකයින් වෙත ඉතා කරුණාවෙන් සැදැහැ සිතින් කෙරෙන තිළිණයකි.

සංස්කාරක

**සුරනි විජේසුරේන්ද්‍ර**

# පටුන

බාහුසච්චඤ්ච සිප්පඤ්ච කියලා මෙච්චර කල් කළේ කුමක්ද? 5

බුද්ධානුස්සතිය නිවැරදිව වඩනවද? 8

ඔබත් පේන දේද දකින්නේ.....? 13

"පියෙහි විප්පයෝගෝ දුක්ඛෝ" 16

තේ එක හරියටම හදල බිව්වොත් සැප තමයි! 18

ඔබත් සංවේදී කෙනෙක් ද ? 20

අවබෝධය 23

ඇතිවෙනකොට නැතිවෙනවා... නැතිවෙනකොට ඇතිවෙනවා.. 26

තිතකින් මතුවූ ප්‍රත්‍යාව 28

පින මනින මීටරේ 30

අයිතිය කාටද? 32

තේ එකක් තුළින් මතුකර ගතහැකි කුසල් සම්භාරය.... 33

අපූරු ගුරුවරයා 35

වැරදුණොත් සසරේ 38

ඔබත් බැරි දේවල් කරන්න යන කෙනෙක් ද? 40

අදින්නා දානා වේරමණී සික්ඛාපදං සමාධියාමි.
කවුද ලොකුම හොරු? 43

ඇහැට පේනවද? 46

මුසාවාදා වේරමණී සික්ඛාපදං සමාධියාමි 48

මහාචාර්ය නොදත් විද්‍යාව 50

බුදුහාමුදුරුවන්ට වැරදුනාද? 52

උගත්කම 55

මෛත්‍රිය ගුණයක් ලෙස වඩනවද? 57

සැලකිය යුතුයි ! 59

පසුවදන 60

# බාහුසච්චඤ්ච සිප්පඤ්ච කියලා මෙච්චර කල් කළේ කුමක්ද?

"බාහුසච්චඤ්ච සිප්පඤ්ච" කියලා මහා මංගල සූත්‍රයේ තථාගතයන් වහන්සේ දේශනා කළේ එදිනෙදා අපි කරන ක්‍රියාව සම්බන්දව මනා පුහුණුව ලබා ශිල්ප දැක්වීමද? නෑ!

ආයතන හය පිළිබඳව සම්මා දිට්ඨිය ප්‍රගුණ කරන ශිල්පය, විරාගයෙන් බලන ශිල්පය ගැනයි මේ කියන්නේ. අපි තුනුරුවන් සරණ යන ආර්ය ශ්‍රාවකයන් ලෙස වැඩිය යුත්තේ පටිසෝතගාමී මාර්ගයක්. නිවැරදි දැක්මක්. නිවනට ගැළපෙන හැටියට දකින්න දක්ෂ වීමක්. අලෝභය, අද්වේෂය, අමෝහය නමැති ශිල්ප පුරුදු කිරීමක්.

එහෙනම් අපි මෙච්චර කාලයක් ලෝකේ දිහා බලලා තියෙන්නේ වැරදි දැක්මෙන්. නැවත නැවත ඉපදෙන දැක්මෙන්. අපි අපේ චරියාවේ දෝස නිදොස් කරන, විනයට ගැළපෙන විදිහට ජීවත් වන ඒ ශිල්පය ඉගෙනගෙන නෑ!

කෙනෙක් පොඩ්ඩක් කොටට ඇඳුමක් ඇඳගෙන හිටියොත් එයා දිහා බලලා අපි කිපෙනවා. නමුත් ඇඳුම් පුලුටක් වත් නැති බල්ලෝ බළල්ලු සුරතල් කරනකොට,

පුංචි ළමයින් ඇඳුම් නැතුව ඉන්නකොට අපට එහෙම හිතෙන්නේ නෑනේ. නමුත් ඒ ළමයම ලොකු වුණාට පස්සේ ඇඳුම් බාගෙට ඇඳගෙන ඉන්නකොට බණිනවා නේද? එහෙනම් අපටයි රාගය ඇවිස්සිලා තියෙන්නේ. ඒ අයට නෙමෙයි. කෙලෙස්වලට අහුවෙයි කියලා අපි පිට ලෝකයාට බණිනවා. අපි අනාර්ය මාර්ගයේ යනවා. අපට තියෙන්නේ මිනිස්සුන්ගේ අඩුව හදන්න නෙමෙයි. තමන්ගේ අඩුව හදාගන්න. තමන්ගේ කෙලෙස් හෙළා දකින්න!

බාහුසච්චඤ්ච සිප්පඤ්ච.. කියන්නේ මේ විදිහට මාරයට විරුද්ධව නැගී සිටීමේ ශිල්පය ප්‍රගුණ කිරීමයි කියලා භාග්‍යවතුන් වහන්සේ දේශනා කරනවා.

ඒ ආර්ය ශ්‍රාවකයා ආයතනවලට උගන්වනවා නිකෙලෙස්ව ලෝකය දකින්න. එයා දන්නවා හතුරන් අකුසල් ගෙවන්නත් මිතුරන් කුසල් ගෙවන්නත් උදව් වෙනවා කියලා. මේ දෙගොල්ලොම රෑ දවල් නොබලා මහන්සි ගන්නේ අපිව රහත් කරවලා පිරිනිවන් පාවන්න කියලා. ඒ යථාර්ථය අවබෝධ කරගැනීම කියන ශිල්පය ප්‍රගුණ කළ යුතුයි කියලයි මේ දේශනා කරන්නේ.

මේ ලෝකේ පුද්ගලයෙක් සත්ත්වයෙක් නැත්නම්, බැණුම් අහන කෙනයි බණින කෙනයි දෙකම කර්මයක් නෙමෙයිද? නමුත් මේ ඇත්ත නොදකින නිසා, අසවලා අපිට බැන්නා, අසවලා අපිව ප්‍රශංසා කළා, අසවලා දුන්නා, අසවලා ගත්තා කියලා අපි නඩු කියනවා. ඒ නිසා ජාති ජරා භව දුක් දොම්නස්වලට හිමිකම් කියනවා. ඇහෙනවා පේනවා නෙමෙයි, මේ කර්ම ගෙවෙනවා කියලා දකින්න පුළුවන් නම් එයා විශාල දක්ෂකමක්

පුරුදු කරල තියෙනවා. කර්මය කර්මයට ඕන ලෙස ගෙවිල යන්න දෙනවා.

සාලයතන නිරෝධය නොදකින තාක්කල් සසරේ යනවා. එහෙනම් සේරම ශිල්ප උගන්වන්න ඕන මේ ආයතන ටිකට. නිවනට ගැළපෙන විදිහට දකින්න, අහන්න, කතා කරන්න, ජීවත් වෙන්න පුරුදු කරන්න වෙනවා.

අපි බණ ඇහුවට තාමත් යන්නේ ලෝභ ද්වේෂ මෝහ, මාන්න, හිතුවක්කාර සරණ. තුනුරුවන් සරණ ගිහින් නෑ. එහෙම ගියානම් භව හතෙන් වැඩ නිමකරන්න එපාය. එහෙම වුනේ නෑ!

එහෙනම් අද ඉඳලාවත් තුනුරුවන් සරණ යන්න. බාහුසච්චඤ්ච සිප්පඤ්ච ගාථාවට අනුව ආර්ය අෂ්ටාංගික මාර්ගය නමැති ශිල්පය පුරුදු කරන්න. කෙලෙස් මාරයා පරාජය කරන්න. කාය වචී මනෝ සංවරය තුළින් අමාරුවෙන් ලබාගත්ත මිනිසත් බවින් උපරිම ප්‍රයෝජන ගෙන

දුකෙන් මිදෙන ශිල්පය නොපමාව ඉගෙනගන්න.

සසර ගමන නිමා කරන්න....

**- උන්වහන්සේ -**

# බුද්ධානුස්සතිය නිවැරදිව වඩනවද?

උන්වහන්සේ - උපාසක මහත්තය හැමදාම බුදුගුණ වඩනවා කියලා කිව්වා. එහෙමද?

උපාසක - එහෙමයි. හැමදාම බුදුගුණ කියලා වන්දනා කරනවා.

උන්වහන්සේ - බොහොම හොඳයි. පළවෙනි ගුණය කියන්න බලන්න..

උපාසක - සියලුම කෙලෙස් නැසූසේක.

උන්වහන්සේ - ඔව් ඒ බුදුහාමුදුරුවොනේ. දැන් උපාසක මහත්තය අද දවසට කීයක් කෙලෙස් නැසුවද? ඊළඟ ගුණය?

උපාසක - සම්මා සම්බුද්ධ නම් වන සේක.

උන්වහන්සේ - ඔව්. සම්මා සම්බුද්ධ වුණේ බුදුහාමුදුරුවොනේ. නමුත් උපාසක මහත්තය මෙහෙම කියලා වැඳලා ආයිත් මල්ලත් අරන් වැඩට ගිහින් සුපුරුදු වැඩ කරනවනේ. ඊළඟ ගුණය?

උපාසක - අෂ්ට විද්‍යාවන්ගෙන්ද සළොස්චරණ ධර්මයෙන්ද යුක්ත වූ සේක

උන්වහන්සේ - ඔව් ඒකත් බුදුහාමුදුරුවන්ගේ ගුණයක්නේ. දැන් ඒක කියලා මහත්තය ආයිත් සුපුරුදු වැඩටික කරන්න යනවනේ.

දැන් මේ ගුණ ඔක්කොම කාගේද? බුදුහාමුදුරුවන්ගෙනේ... ඒ බුදුගුණ තමන් තුළින් දැක්කද? තථාගතයන් වහන්සේ කිසිම තැනක "මගේ ගුණ මෙනෙහි කරන්න. එතකොට ඔයගොල්ලන් නිවන් දකිනවා" කියලා කොහෙවත් කියලා නෑ. 84000 හේ කොහෙවත් එහෙම ලියවිලා නෑ. මම සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් ගුණ වැඩුවා.

ඒ නිසා ඒ ගුණ ගායනා කළා කියලා ඔබලා නිවන් යනවා කියලා කොහෙවත් කියලා නැනේ. පුදුම වැඩේ...අනුන්ගේ ගුණ ගැයුවා කියලා තමන් නිවන් යනවද? ඒක හරියට අනුන් බෙහෙත් බොනවා බලන් හිටියහම තමන්ගේ ලෙඩේ හොඳ වෙනවයි කියලා හිතනවා වගේ වැඩක්නේ. පෙත්ත අතට ගන්න ඕන. බෙහෙත් බොන්න ඕන. එතකන් ලෙඩේ හොඳ වෙන්නේ නෑ.

බුද්ධ කියන්නේ මොනවද?

තථාගත ගෞතමයන් වහන්සේ නෙමෙයි. මේ නාමරූපවල පවතින නිර්වාණ ධර්මය තමයි බුද්ධ. යමෙක් මේ නාමරූපවලින් තථාගතයන් වහන්සේ දකිනවා නම් ඒ දකින්නේ "බුද්ධ". යමෙක් ඇත්තටම "බුද්ධ" දකිනවා නම් එයා දකින්නේ මේ නිර්වාණ ධර්මය.

බුදුරජාණන් වහන්සේ ලෝක සත්ත්වයා කෙරෙහි අප්‍රමාණ මෛත්‍රියෙන් කටයුතු කළානම් මමත් ඒවගේ එදිනෙදා හමුවන හැමෝම කෙරේ මෛත්‍රී සිතින් කටයුතු කරනවා.

බුදුහාමුදුරුවෝ මහා කාරුණික වුණා වගේ මමත් කව්රු මොනා කිව්වත් මොන අපහසුතාවයට පත්වුණත් ඒ ගුණය මගේ චරිතය තුලින් වඩනවා.

බුදුහාමුදුරුවන්ට තිබුන ගුණ බුදුහාමුදුරුවන් තුළින් බලනවා නෙමෙයි. උපාසක මහත්තයෝ මේ බඹයක් පමණ ශරීරය තුළින් බලන්න පටන්ගන්න ඕන.

භාග්‍යවතුන් වහන්සේ මේ ලෝකේ කිසිම කෙනෙක් හෙළා නොදකින සේක. හැබැයි මම හෙළා දකිනවනේ. ලුණු අඩුවුනත් හෙළා දකිනවා. ලුණු වැඩිවුණත් හෙළා දකිනවනේ.

භාග්‍යවතුන් වහන්සේ පුරිසධම්ම සාරතී වන සේක. හරි නේද? පුරුසයන් දමනය කළානේ. හැබැයි මම... දරුවා කෑගැහුවත් තරහයනවනේ. පොඩ්ඩ එහෙමෙහෙ වෙන්න බෑනේ. මනුස්සයෙක් කරුණාවෙන් දයාවෙන් දමනය කරන්න මම දක්ෂ වෙලා නෑනේ. එතකොට උපාසක මහත්තය මෙච්චර කාලයක් බුද්ධානුස්සතිය වැඩුවේ බුදුහාමුදුරුවන්ට මිසක් තමන්ට නෙමෙයි. පිරිනිවන්පාපු බුදුහාමුදුරුවන්ට මොකටද

බුද්ධානුස්සතිය!

බුදුහාමුදුරුවන්ට මේ මේ ගුණ තියෙනවයි කියලා මුළු ලෝකෙම දන්නවා. බුදුහාමුදුරුවෝ තුළ මේ ගුණය තියෙනවා, අර ගුණය තියෙනවා කිය කියා ඉන්නවා

මිසක් ඒ ගුණ තමාගේ චරිතය තුළින් කොයිතරම් ලෝකෙට විද්‍යමාන කරල තියෙනවද?

උපාලි තෙරුන්ට මේ ගුණ තිබුණ. සැරියුත් මුගලන් දෙනමට මේ ගුණ, කාශ්‍යප මහරහතන් වහන්සේට මේ මේ ගුණ තිබුණා. තිබුණ නිසාතමයි උන්වහන්සේ, පිරිනිවන් පෑවේ.

හැබැයි මට මොනවද තියෙන්නේ? මට මොකවත් නෑනේ!

තමන්ගේ චරිතය තුළින් වඩන්නේ නැතුව කියකිය ඉන්නවා කියන්නේ හරියට අනුන්ගේ සින්දුවක් කියනව වගේනේ. මම පදරචනය කළෙත් නෑ. ගායකයත් මම නෙමෙයි.

ඒ සින්දුවේ කිසිම අයිතියක් මට නෑ. අනුන්ගේ සින්දුවක්!!

තථාගතයන් වහන්සේ තුළ තිබූ මේ උත්තරීතර ගුණයන් ඔබේ චරිතය තුළින් පෙන්වන්න දක්ෂ නොවන තාක්කල් ඔබ කොච්චර බුදුගුණ කිව්වත් බුද්ධානුස්සතිය නම් වැඩෙන්නේ නෑ. බුදුගුණ පොත්පිටින් කියෙව්වත් සජ්ඣායනා කළත්, ඔබේ චරිතයේ කිසිම වෙනසක් වෙලා නැත්නම් තිබුණ කලබලේ එහෙමම නම් ඒ කියන්නේ බුදුගුණ වැඩිලා නෑ.

උපාසක මහත්තයෝ අද ඉඳලා නිවැරදිව බුදුගුණ වඩන්න ඉගෙනගන්න. ඔබේ චරිතය තුළින් බුදුගුණ ස්පර්ශ කරන්න දක්ෂ වෙන්න. එතකොට තථාගතයන් වහන්සේ ඔබේ චරිතය තුළ ජීවමානව වැඩවසන බව දැනේවි. ඔබ සුවපත් වේවි. ඒ වෙනස ඔබ තුළින් ඔබට

පෙනේවි. අන්න එදාට සත්‍ය වශයෙන්ම බුද්ධානුස්සතිය තුළින් පිරිනිවීමට මගපෑදේවි....

- **උන්වහන්සේ** -

# ඔබත් පේන දේද දකින්නේ.....?

ආර්ය ශ්‍රාවකයෙක් නාම රූප සැක කළ යුතුද? විශ්වාස නොකළ යුතුද?

විශ්වාස නොකළ යුතුයි. එයයි නිවැරදි පිළිතුර. එහෙනම් මම දකින මේ අල්මාරිය ඇත්තටම අල්මාරියක්ද? නෑ!

අල්මාරිය කියන නමින් මේ නාමරූපය නිර්මාණය වෙන්න කලින් ඒක ලී මඩුවේ ලී ගොඩක්. ලී ගොඩ කියන නාම රූපය නිර්මාණය වෙන්න කලින් ඒක කොටන් වගයක්. ඊට කලින් ඒක ගහක්. ගහක් වෙන්න කලින් ඒක බීජයක්. ඇටයක්. ඊටත් කලින් ඒක අණු ප්‍රමාණයක්. අණුවලට කලින් මොනවද ඒක? තරංගයක්. දැන් ඇත්තටම මම දැක්ක මේ අල්මාරිය, අල්මාරියමද? එහෙනම් මේ පෙන්නේ අල්මාරියක් කියලා මට විශ්වාස කරන්න බෑ.

"අපි දකින දේ ඇත්ත නෙමෙයි" කියලා කිව්වා මිසක් අපි දකින්නේ බොරුවක් කියලා බුදුහාමුදුරුවෝ කවදාවත් දේශනා කළේ නෑ. ඇයි?

අපි දකින්නෙම බොරුවක් කියලා තථාගතයන් වහන්සේ යම්කිසි ධම්ම පදයක් දේශනා කෙරුවොත් අපිට ප්‍රශ්නයක් අහන්න පුළුවන්..

"අවසරයි භාග්‍යවතුන් වහන්ස, දකින දේ බොරුවක් නම් ඒ බොරුව තීරණය වුනේ යම්කිසි ඇත්ත ධර්මතාවයකට සාපේක්ෂව. ඒ ඇත්ත ධර්මතාවය කොහෙද තියෙන්නේ?" කියලා.

එතකොට භාග්‍යවතුන් වහන්සේ හිරවෙනවා. ඇයි? ඇත්ත ධර්මතාවයක් ලෝකේ නෑනේ. අන්න ඒ නිසා!

සබ්බේ සංකාරා අනිත්‍ය නම් ලෝකේ හැමතැනම තියෙන්නේ මොනවද? බොරුව. හැමදේම අනිත්‍යයි නම් භාග්‍යවතුන් වහන්සේ මේ අනිත්‍යයි කියලා අදහස් කරන්නේ කුමක්ද ? නිත්‍ය එකකට සාපේක්ෂව හටගත් අනිත්‍ය ධර්මතාවය නෙමෙයි.

"සබ්බේ සංකාරා" තුළ නිත්‍ය කියලා සංසන්දනයක් නෑ. ඔක්කොම අනිත්‍යයි. දේශනා කරන තථාගතයන් වහන්සේත් අනිත්‍යයි. දේශනා කරන ධර්මය? ඒකත් අනිත්‍යයි. එතකොට අවබෝධ වුන සිත? සිතත් අනිත්‍යයි. අවබෝධය? ඒකත් අනිත්‍යයි.

"සබ්බේ සංකාරා" ඒක තුළ සියල්ලම ගැබ්වී තියෙනවා. එදිනෙදා ජීවිතේ ස්පර්ශය තුළ පරිබෝජනය තුළදී "දකින්නේ ඒ පේන දේ නෙමෙයි" කියන අවබෝධය තුළ හිටියොත්, කෙලෙස්වලට බැරිලු අපිව ස්පර්ශ කරන්න. ඒ අවබෝධය වැඩිදියුණු කරන ප්‍රමාණයට ටික ටික කෙලෙස් ළංනොවන තත්ත්වයට පත්වෙනවා. කෙලෙස්වලින් මිදෙන තරමට දුකින් මිදෙනවා. ඒක ලොකු ජයග්‍රහණයක්!

ආර්ය ශ්‍රාවකයෙක් නිරෝධ සමාපත්තියට එනතුරු කිසිම නාමරූපයක් විශ්වාස නොකළ යුතුයි. හේතුව ඒ

නාමරූපවල මාරයා වාසය කරන නිසා. නාම රූප තුළින් රාගය, ද්වේශය, මෝහය, මුළාව මතුකරන්න පුළුවන්. ඒ නිසා ආර්ය ශ්‍රාවකයා පරිස්සම් විය යුතුයි!

- **උන්වහන්සේ** -

## "පියෙහි විප්පයෝගෝ දුක්ඛෝ"

ප්‍රියයන්ගෙන් වෙන්වීම දුකයි කියන තථාගත පණිවුඩය ඔබට අවබෝධ වෙලාද?

"පියෙහි විප්පයෝගෝ දුක්ඛෝ" කියලා කියන්නේ අම්මගෙන් තාත්තාගෙන් ඈත්වීම දුකයි, රස්සාව අහිමිවීම දුකයි, දරුවන්ගෙන් මුණුබුරන් මිනිබිරියන්ගෙන් ඈත්වීම දුකයි කියන එකද? මේ දුක ගැන නෙමෙයි භාග්‍යවතුන් වහන්සේ දේශනා කරන්නේ. එහෙම දුකක් ඒ දේශනාව තුළ නෑ!

පියෙහි කියලා කිව්වේ කාමලෝකයට නෙමෙයි. පංචකාමයට නෙමෙයි. පංචස්කන්ධය පිනවන ධර්මතාවයටත් නෙමෙයි. "පියෙහි" කියන්නේ නිවනට! යමෙක් මේ නිවනට අදාළ ධර්මතාවලින් වෙන්වෙනවා නම් එයා ඒකාන්තයෙන් මේ නාමරූපවලින් දුකට පත්වෙනවා.

ප්‍රියයන්ගෙන් වෙන්වීම කියන්නේ තථාගත පණිවුඩය. ඒක අපේ නිරෝධ සමාපත්තිය. අනන්ත සංසාරේ අපි ප්‍රියයන්ගෙන් වෙන්වුණා. අපේ නිවන අපි ප්‍රතික්ෂේප කළා.

සම්මා දිට්ඨිය කොයිතරම් ප්‍රියද? පිරිනිවන් පාන්න තරම් ප්‍රියයි. සියලු දුකෙන් නිදහස් වෙන්න තරම් ප්‍රියයි.

සම්මා දිට්ඨිය බැහැර කරල මිච්ඡා දිට්ඨියක් තුළ නම් වාසය කරන්නේ,.. මම දැක්කාය මට පෙනුනාය කියලා තම කම නිර්මාණය වෙනවා නම් ආත්ම දෘෂ්ටිය හදනව නම් එයා ඉන්නේ දුකේ. සම්මා දිට්ඨිය කියන ප්‍රියෙන් ඈත්වූ නිසා දුකයි!

සම්මා සෝතය කියන ප්‍රියෙන් ඈත්වූ කෙනා හැම වචනයකටම පොලු අරන් ගැටෙන්න සූදානම්. ඒවගේම වචනවලට ඇලෙනවා. දුකයි!

කම්මන්තය, වායාමය, ආජීවය කියන නිවැරදි ජීවිතය, හැසිරීම, නිවැරදි ජීවන රටාව කියන ප්‍රියයන්ගෙන් වෙන්වෙලා... දුකයි!

හරිම අවිවේකයි. සිතුවිලි නිසා කලබල වෙලා. රුධිර පීඩනය වැඩිවෙලා. නිදහස් විවේකයක් ඇත්තෙම නෑ. වරද තමන්ගේමයි. සම්මා සමාධිය කියන ප්‍රියයන්ගෙන් වෙන්වෙලා. දුකයි!

අද අපි ජීවිතේ යම්කිසි දුකක් විඳිනවා නම් ආර්ය අෂ්ටාංගික මාර්ගය නමැති මේ ප්‍රියයන්ගෙන් වෙන්වීමමයි ඒ සියලු දුකට හේතුව. තථාගතයන් වහන්සේ එදා දේශනා කරනලද දම්සක් පැවතුම් සූත්‍රයේ එන පියෙහි විප්පයෝගෝ දුක්ඛෝ අද මගේ ජීවිතයට කොයිතරම් සම්බන්ධ වෙච්ච දහම් කරුණක්ද?

මේ මොහොතේ පටන් අපේ සියලුම දුක් නිරෝධ කරගන්න මේ තථාගත බුද්ධ වචනය උපයෝගී කරගමු!

- **උන්වහන්සේ** -

# තේ එක හරියටම හදල බිව්වොත් සැප තමයි!

තේ එකක් හදනකොට උණුවතුර, තේ කොළ, සීනි, පිටි ආදී අමුද්‍රව්‍ය පාවිච්චි කරනවනේ. නමුත් අපි වටිනාකම් දෙන්නේ මේ තේ කියන එකටද නැත්නම් ඒ අමුද්‍රව්‍ය ටිකටද? තේ එකට නේද?

එතකොට ඒ අමුද්‍රව්‍ය නිසානේ තේ එකක් හැදුනේ? ඇයි ඒ අමුද්‍රව්‍යවලට වටිනාකම නැතුව ගියේ?

අපි කවදාවත් තේ එකක් බොනකොට උණුවතුර බොනවා, සීනි බොනවා, කහට බොනවා, පිටි බොනවා කියලා කියනවද? නෑනේ. වටිනාකම දෙන්නේ තේ එකට.

එහෙනම් අපි මේ පඨවි, ආපෝ, තේජෝ, වායෝ කියන මේ සතර මහා භූත තුළ යම්කිසි සම්මා දිට්ඨියක් ස්පර්ශ කරනකොට වඩනකොට මොනතරම් බාහිර නාමරූප එකතුකෙරුවත් ඒ සම්මා දිට්ඨිය නමැති නිම් භාණ්ඩය හදන්න පාවිච්චි කරපු නාමරූප කියන අමුද්‍රව්‍යවලට නෙමෙයි වටිනාකම දෙන්නේ. ඒ සම්මා දිට්ඨිය කියන නිම් භාණ්ඩයටයි වටිනාකම දෙන්නේ. ඒ ශ්‍රාවකයා නාමරූප විශාල ප්‍රමාණයක් එක්ක ගනුදෙනු කරල තමයි ඒ සම්මා දිට්ඨිය නමැති අවබෝධයට පත්වෙන්නේ.

පිටි සීනි තේකොළ උණුවතුර පාවිච්චි කරල රසට තේ බීල සැපක් ගන්න දක්ෂ වෙනවා වගේ නාමරූප නමැති මේ ලෝකේ බොරුව සමග පොරබැදල යමෙක් සම්මා දිට්ඨිය නමැති ලෝක සත්‍යය අවබෝධයට පත්වෙන්න දක්ෂ වුණොත් ඒ ශ්‍රාවකයා "නතේ භවං අට්ටමං ආදියන්ති" අටවෙනි භවයකට නොයා සදාතනික සැපය නමැති උත්තරීතර නිර්වාණය සාක්ෂාත් කරනවා නියතයි!

- **උන්වහන්සේ** -

# ඔබත් සංවේදී කෙනෙක් ද ?

දවසක් මමයි සීයයි කෑම කනවා. අපි දෙන්න තමයි ඉස්සෙල්ලම කෑම කන්නේ. ආච්චි කන්නේ හැමදාම අන්තිමට. සීයා කාල ඉවරවුනහම ඒ තැටියටම බත් දාගෙන තමයි ආච්චි කන්නේ.

දවසක් අපි කෑම කනකොට....

සීයා - අදනම් මට බඩ පිරුන වැඩියි. මීටවඩා කන්න අමාරුයි.

මම - මමත් මේ කියන්නේ කොහොමද කියලා හිතුවේ සීයේ, මගේ බඩත් හොඳටම පිරිලා.

සීයා - මාරවැඩේ.. අපි දෙන්නටම කන්න බෑනේ. එහෙනම් නැගිටිමු නේද?

ටිකකට පසු මේක දැකල ආච්චි "මෙච්චර ඇයි මේ ඉතුරු කළේ. එහෙනම් මම කනවා." යනුවෙන් පවසා ඒ ඉතුරු බත් ටික කෑවා.

පැයක් විතර ගියාට පස්සේ ආච්චි දුවගෙන ඇවිත් අඬාගෙන සීයාගේ කකුල අල්ලලා වැන්ද. සීයා ආච්චිගේ ඔළුව අතගාලා මොකක්ද ප්‍රශ්නේ කියලා ඇහුව.

ආච්චි - මගෙ අතින් වරදක් වුණා.

මේ වෙලාවේ සීයා මගේ දිහාත් බැලුව. මම හෙමින් සැරේ අහස දිහා බැලුව. එතකොට සීය දැනගත්ත මමත් ඒක දන්න බව.

සීයා - කමක් නෑ. මීට පස්සේ කරන්න එපා.

ආච්චි කල්පනා කළාලු. "ඇතුළේ බත් නෑ කියන එක මම කිව්වේ නෑ. හැබැයි මේ දෙන්නම බත් ඉතුරු කළානේ. සාමාන්‍යයෙන් කනවිදිහට කෑවෙත් නෑනේ. කොහොමද මේක අහුවුණේ? මම මෙච්චර පරිස්සමට සංවරව කටයුතු කළානේ. කිසිම තැනක අසිහියක් තිබුණේ නෑ. බත් දානකොට ලොකු පිඟන්වලට දැම්මොත් ප්‍රමාණය පොඩියි වගේ පෙනිලා බත් අඩුයි කියලා මේ දෙන්න දැනගන්නවා. ඒ නිසා පොඩි පිඟන් දෙකකට ගොඩගහල දැම්මම ලොකුවට තියෙනවනේ. එතකොට බත් මදි බවක් පෙන්නේ නෑ. මේ දෙන්න හොඳට කයිනේ කියලා මම හරියටම ප්ලෑන ගැහුවනේ. කොතනද මේක වැරදුනේ?..."

ආච්චි - මම කරපු වරද කිව්වේ නෑනේ. කොහොමද දැනගත්තේ?

සීයා - අපිට බත් බෙදලා බත් මුට්ටියේ තිබුණ අන්තිම බත් ටික

පොල්කටු හැන්දෙන් බෙදාගන්න යනකොට හැන්ද මුට්ටියේ යට කොටසේ ඇතිල්ලීගෙන යන සද්දේ ඇහුණා අපිට. එතකොට අපි දැනගත්ත මුට්ටියේ බත් නෑ කියලා. ඒකයි ඉතුරු කළේ.

පස්සේ ආච්චි තේරුම් ගත්තලු

"අර මුට්ටිය හූරන සද්දෙන් තමයි මේ දෙන්න මේක තේරුම් ගත්තේ. අනේ.. මම වෙනුවෙන් මේ

දෙන්න කෑම වේල අත්හැරිය. මම වෙනුවෙන් කෑම ඉතුරු කළානේ....." යනුවෙන් හිතමින් ආච්චි සංවේදී වුණා මට මතකයි.

ඉතින් සංවේදීකම අපේ පවුල්වල අය ළඟ තිබුණ බවට ඔය එක උදාහරණයක් විතරයි. සංවේදී කියන එක කෙලෙසයක් නෙමෙයි. ඒකෙ තේරුම යමක් වෙනකොට ඒක දරාගන්න බැරුව කැලඹෙන ස්වභාවය නේද?

ආර්ය ජීවිතයේදී අපේ මාර්ගය පිළිබඳව ගුණධර්ම පිළිබඳව අපි සංවේදී විය යුතුයි. "අනේ මේ ගුණය මට නෑනේ. මේක කොච්චර ලස්සන ගුණයක්ද.. අසූ මහා ශ්‍රාවකයන් ළඟ මේ ගුණය තිබුණා. මගේ ළඟ නෑනේ! මම කොහොමහරි මේ ගුණය වඩනවා!" කියලා සංවේදී වෙනවා.

මෙසේ අපේ ජීවිත තුළ සංවේදී වෙනවා කියන දුර්වලකම ආයෝජනය කරල අපිට අපේ පාරමී ටික පුරන්න පුළුවන්නේ... අනෙක් අය ගැන හිතල වැඩකරන කොට දානපාරමිතාව දන්නෙම නැතුව පිරෙනවනේ.

සංවේදීකම දුර්වලකමක් නොවේ. අපි නිවැරදිව එය නිවනට ආයෝජනය කරන්න දන්නේ නෑ. ආයෝජනය කරන්න දක්ෂ වුණොත් ඒකෙන්ම ගොඩයන්න පුළුවන්!!

**- උන්වහන්සේ -**

# අවබෝධය

උන්වහන්සේ - උපාසක මහත්තයෝ.... යමෙක් හැම දේටම සාදුකාර දෙනවනම් මොකක්හරි දෝසයක් තියෙනවා. එක්කෝ ඒ මනුස්සයා බෙහෙත් බීලා නෑ. එහෙම නැත්නම් එයාට ලෙඩක් තියෙන බව දොස්තර මහත්තුරු හොයාගෙන නෑ. නිවැරදි දේ හොයාබලලා සාදුකාර නොදෙන ශ්‍රාවකයින් සාසනයට වැඩක් නෑ.

උපාසක මහත්තයට සිතිවිලි ඇතිවෙන එක නවත්තන්න පුළුවන් ද?

උපාසක - බැහැනේ. හැබැයි මේ සිතිවිලි හරි වදයක් කියලා හිතෙනවා.

උන්වහන්සේ - උපාසක මහත්තයෝ... සිතිවිලි ඇතිවෙනඑක නෙමෙයි ප්‍රශ්නේ.

ඒ සිතිවිලි නිසා ලෝභ ද්වේෂ මෝහ කෙලෙස් වලට අහුවෙන එකයි වැරැද්ද. ඒක හරිද? වැරදිද?

උපාසක - ඒක හරි.

උන්වහන්සේ - වැරදියි!

කෙලෙස් නිර්මාණය වෙනවයි කියන්නේ අකුසල් නිසා ඇතිවන ක්‍රියාවලිය.ඒක අවබෝධ වුනහම අකුසල් පත්ත නැවැත්තුව.

නමුත් කුසල් නිර්මාණය වෙන පත්ත නැවැත්තුවද?

ඒ කියන්නේ මෙයා නවත්තලා තියෙන්නේ අපායට, ප්‍රේත, භූත තිරිසන් වගේ පහළ තලවලට යනඑක විතරයි. උඩ තලවලට යනඑක නවත්තල නෑ. සිතිවිලිවලින් හටගන්නාවූ කෙලෙසයන් නැවැත්තුවට හරියන්නේනෑ. නිකෙලෙසයන් නවත්තන්නත් ඕන. අකුසල් ටික නැවැත්තුව. ඒ කර්ම නිර්මාණය වෙන්නේ නෑ.

නමුත් කුසල් නැවැත්තුවේ නෑ.

එක පැත්තක් හදල. අනෙක් පැත්ත හදල නෑ.

ඇතිවෙන සිතිවිලිවලින් කුසල් අකුසල් දෙකම නිර්මාණය නොවී කර්ම හැදෙන්නේ නැත්නම්....

හරියටම හරි!

ඒක තමයි රහත් බෝධියේ උත්තරය.

සමහර මිනිස්සු ජීවිත කාලය පුරාම අසත්පුරුෂ වැඩමයි කරන්නේ. පින්දහම් පන්සල් මොකවත් නෑ. හාමුදුරුවන්ව සත පහකට ගණන් ගන්නේ නෑ. බණ පදයක් අහන්නේ නෑ.

ඒ මනුස්සය කුසල් පැත්ත සම්පුර්ණයෙන් නවත්තල අකුසල් පැත්තට හැරිලා ඉන්නේ.

පල්ලෙහා ඉපදෙනවා.

තවත් කෙනෙක් අකුසල් පැත්ත සම්පූර්ණයෙන් නවත්තල සාදුකාර දීගෙන බුදුන් වැඳගෙන බණ භාවනා කරමින් කුසල් පැත්ත වඩල උඩ තලයක ඉපදෙනවා.

දැන් දෙන්න දෙපැත්තේ ඉපදෙනවා නම් මේ දෙන්නම නිවන් දැකලද?

උත්තර දෙකම වැරදියි.

චෛතසික ඇතිවීම වරදක් නෙමෙයි. ඒ ඇතිවන චෛතසිකවලින් කර්මය නිර්මාණය වෙන්නේ නැත්නම් අන්න හරියටම හරි!

එයා කොහෙවත් ඉපදෙන්නේ නෑ. එයා පිරිනිවන්පානවා.

පිරිල නිමිල යනවා!!

**- උන්වහන්සේ -**

# ඇතිවෙනකොට නැතිවෙනවා...
# නැතිවෙනකොට ඇතිවෙනවා..

හිමිවීම / ඇතිවීම තුළ දුක හටගන්නේ ලෝභය මුල්කරගෙන. අපට මොනාහරි ලැබුණම එම වස්තුවේ වටිනාකමට බැඳීමට සාපේක්ෂව ලෝභය කියන අකුසල මූලය මුල්කරගෙන දුක හටගන්නවා.

නැතිවෙනකොට / අහිමිවීම තුළ මේක මගෙන් පැහැරගත්තනේ කියලා "නැතිවුණා" කියන මානසිකත්වය තුල ද්වේෂය මුල් කරගෙන දුක හටගන්නවා.

එහෙමනම් අපට යමක් හිමිවනවිට ලෝබය මුල් කරගෙනත් අහිමිවනවිට ද්වේෂය මුල් කරගෙනත් දුක හටගැනීමක් සිදුවෙනවා.

මේ ඇතිවීමෙන් ඇතිවෙන දුකත් නැතිවීමෙන් ඇතිවන දුකත් නිරෝධය කරන්නේ කොහොමද කියලා ආර්ය අෂ්ටාංගික මාර්ගයට අනුව බලන්න වෙනවා.

ඇතිවෙනකොට අපි දැනගන්න ඕන මේක ඇතිවුනේ නැතිවෙන්නමයි කියලා. ඒ ධර්මතාවය දැනගත්තහම, යමක් ඇතිවන විටම නැතිවෙන බවට මානසිකත්වය නිර්මාණය වී ඇති නිසා අපි ඒකට ලෝබයෙන් වටිනාකම් දෙන්නේ නෑ.

අපි දන්නවා මේ හිම්වෙලා තියෙන කය කවදාහරි ලෙඩ වෙනවා, වයසට යනවා, කවදාහරි පොළොවට පස්වෙනබව.

වස්තූත් එහෙමයි.

දිරාපත්වෙලා පොළොවට පස් වෙනවා. මේ ධර්මතාව දැක්කම එයාතුළ ලෝභය වෙනුවට අලෝභයක් නිර්මාණය වෙනවා. කවදාවත් වටිනාකමක් ලැබෙන්නේ නෑ. ඒ නිසා ඇතිවීම තුළින් එයාට දුකක් හටගන්නේ නෑ.

ඒ වගේම තමයි නැතිවෙනවිටත්...

නැතිවෙනවිට නැතිවෙනබව කලින් දැනගෙන හිටපු නිසා කම්පාවකුත් නෑ. හැබැයි නැතිවෙන්නෙම නැවත එකක් ඇතිවෙන්න නේ!

මෙහෙම කියනකොට කෙනෙක් කියන්න පුළුවන් "මොකවත් ඇතිවුනේ නැහැනේ. තිබ්ච්ච දේ නැතිවුණා විතරයි නේ" කියලා... ඔව් ඒ වස්තුව එක්ක තිබ්ච්ච බැඳීම් නැතිවුණා. නඩත්තු කිරීම නතරවුණා.

එතකොට ඇතිවුනේ කුමක්ද?

නිදහස ඇතිවුණා! විවේකය ඇතිවුණා! එතකොට නැතිවීම තුළින් ඇතිවෙලා.. ඒ ධර්මතාවය දැක්කම ද්වේෂය වෙනුවට අද්වේෂය නිර්මාණය වීම නිසා දුකක් ලැබෙන්නේ නෑ.

මෙන්න මේ විදිහට ඇතිවීමේදී නැතිවීමත් නැතිවීමේදී ඇතිවීමත් අවබෝධ වන ප්‍රමාණයට එයා මේ ධර්මතා දෙක තුළින්ම දුකින් නිදහස් වෙනවා!

**- උන්වහන්සේ -**

# තිතකින් මතුවූ ප්‍රත්‍යාව

උන්වහන්සේ - මේක ගැන මොනවද කියන්න තියෙන්නේ?

ගෝලයා - ආ.. මේ කළු ගල් කැටයක් නේ. ස්වාමිනී මේකේ කඩතොලු තියෙනවා. එක පැත්තක් ටිකක් පැතලියි. කළු පාටයි නේ.

මෙලෙස ගෝලයා තවත් ගොඩක් කරුණු පැවසුවා. ඉන්පසු එම ගෝලයාටම කොළයක් උඩ තිතක් තියා පෙන්වූ උන්වහන්සේ දැන් මොනවද පේන්නේ කියලා ඇසුවා. එවිට

ගෝලයා - ස්වාමින් වහන්සේ මේක තිතක්නේ.

උන්වහන්සේ - මහපොළොව තරුවක් වගේ පේනකොට ප්‍රශ්න තියෙනවද?

එක ප්‍රශ්නයක්වත් නෑ. තෙල් ප්‍රශ්න, ලයිට් ප්‍රශ්න, කෑම ප්‍රශ්න, ගංවතුර ප්‍රශ්න මොකවත් නෑ. තරුවක් නේ. තවත් ඈතට ගියහම පුංචි තිතක්නේ. ප්‍රශ්න නෑ.

හැබැයි... කොහොමද ඒ තරුවට ගිහිල්ල land වුනානම්!!

ඉඩම් නඩුම තියෙනවලු ලක්ෂ එකහමාරක්!

දික්කසාද නඩු ලක්ෂ පහත් පැනලලු! ඔළු පළපුව දත් කඩපුව වෙනම තියෙනවලු. සිවිල් නඩු!

මාර්ගය වඩන තාපසයෙක් නාම රූප ළඟට අරන් බලන්නෑලු. දුර තියාලු බලන්නේ. ඒවා පොඩියි. සරලයි. ගෙදර කෙනා මැරෙනකොට තියෙන කලබලේ, වෙන කෙනෙක්ගේ මරණය කියලා News වලට කියනකොට දැනෙන්නේ නැහැනේ. තේ බිබී කඩල කකා "හානේ.. මාරවැඩේ... මෙච්චර ගාණක් මැරිලා.. එතනම හැප්පිලා මැරිලනේ. මාරවැඩේ" කියලා තමයි බලන්නේ. අපේ කෙනෙක් නෙමෙයිනේ. දුර තියලා බලනවා. එතකොට බැඳීම් ගොඩක් අඩුයි. වටිනාකම අඩුයි. ඇලීම් ගැටීම් අඩුයි. එතකොට ඉපදීමේ ධාරිතාව අඩුයි. මේවා තමයි වටහා ගන්න ඕන. Practice කරන්න ඕන.

නිවන් දකිනවා කියන එක, වඩේ, හැලප, sandwich වගේ හදල දෙන්න බෑ. තථාගත පණිවුඩය ප්‍රායෝගිකයි. ඒක තමන් තුළින් ගොඩනගන්න ඕන. සෑම මොහොතකම අවබෝධ කරන්න උත්සහ කරන්න ඕන. මේ විදිහට ටිකෙන් ටික වඩල ඉපදීම තුනී කරමින් කවදාහරි දවසක ඉපදීම නවත්තන්න ඕන. අන්න එදාටයි සියලු දුකින් නිදහස් වෙන්නේ....

- **උන්වහන්සේ** -

# පින මනින මීටරේ

කිසිම තථාගතයන් වහන්සේ නමක් ලෝභයට පින් කරන්න කියලා නෑ. නමුත් ලෝකේ 99% ක්ම පින් කරන්නේ ලෝභයට. ළමයාගේ විභාගේ පාස් වෙන්න, ලෙඩ හොඳ වෙන්න, අදායම් වැඩිකරගන්න, සුගතිගාමී වෙන්න ආදී විවිධ බලාපොරොත්තු ඇතුවයි පින් කරන්නේ. පුජා පවත්වන්නේ.

පූජාව තියලා ගාථාවල් කියලා ඒක තුළින් සතුටක් තෘප්තියක් ලබනවා නම් ඒක ආමිසය. පිරිකර 5000 ක් තිබ්බම පුදුම සතුටක්! ඒ ආමිසය.

කෙනෙක් තමන් කරන පුද පුජාවලින් සෑහීමකට පත්වෙන්නේ නෑ. ඒ පුජාවන් තුළින් සාසනේ අභිවෘද්ධිය දකිනවා. සියලු සත්ත්වයන්ගේ නිරෝධය දකිනවා. ඒක ප්‍රතිපත්තිය!

කෙනෙක් බුදුන්ට මල් පූජා කරල සතුටු වෙනවා. එතන ආමිසය..තවත් කෙනෙක් එසේ මල් පූජා කරල "මේ මල් පූජා කරන්න මං ඉපදුනා. ඒ ඉපදීම දුකක්! මල් පරවෙනවා. මමත් එහෙමයි. මහලු වෙනවා. ලෙඩ වෙනවා. මරණයට පත්වෙනවා." කියන නිමිති ඒ තුළින් දකිනවා. මෙලෙස මල් පූජා කිරීම තුළින් එයා කමටහන් වඩල නිරෝධයට අදාළ ප්‍රතිපදාව දකිනවානම් ඒක ප්‍රතිපත්තිය.

එහෙනම් අද ඇයි මෙච්චර පූජා පවත්වන්නේ?

ඒකට හේතුව නිවන් දකින්න පින් මදි කියන මතය.

පින් මදි කියලා හිතන අයට තේරෙන්නේ නෑ

1. මිනිසත් බව / කය ලැබුණ කියන්නේ පින 70%ක් පිරිලා
2. දුක දැනෙනවා කියන්නේ 80%ක් පින පිරිලා
3. නිරෝධ කරන්න අවශ්‍යතාව එනවා කියන්නේ 90% ක්ම පින පිරිලා ඉවරයි කියන එක...

මේක තේරුම් ගන්න තරම් ප්‍රඥාවක් නැති නිසා මිනිස්සු අද දුර්වල වෙලා.. පින් කරකර ඉන්නවා! නැවතත් උපදිනවා!!

- **උන්වහන්සේ** -

# අයිතිය කාටද?

මහ මුහුදට තාප්පයක් ගහල කොටස් වෙන්කරලා මට අයිතියි කියලා හෝ හුළං ටික ටැංකි බැඳලා අරන් තියාගෙන අයිතිය ප්‍රකාශ කරන්න හෝ මේ අක්කර ගාණක වැස්ස මගේ අහස මගේ කියල අයිතිය ප්‍රකාශ කරන්න තරම් අපි මෝඩ නෑ නේද?

මේ සතර මහා භූතයන්ගේ කිසිවක් අයිති නෑ කියලා දන්න අපිම, මේ සතර මහා භූත සියල්ල එකතු වී හැදුන සියල්ලටම අයිතිවාසිකම් කියනවනේ.. හරි පුදුමයි!

භෞතික කෝප්පෙට පිඟානට, පොත් පත්වලට, මේ වාසය කරන කුටියට, ගෙදරට, වාහනයට, පන්සලට, සංඝයාට, පිරිකරට ආදී පරිහරණය කරන, මුණගැහෙන සියලුම දේට, අයිතිවාසිකම් කියන්න හිතෙන්නේම අපේ ප්‍රඥාව මදිකම නිසාමයි.

මේ සත්‍යය අවබෝධ නොවන තාක්කල් අපි මේ ලෝකේ තුළ අයිතිවාසිකම් කියමින් ලෝභය වඩමින් ඒවා අහිමි වීම තුළ ද්වේෂය වඩමින් සසර නිර්මාණය කරගන්නවා.. මේ පුංචි කරුණ තේරුම් ගන්න බැරිනම් කෙලෙස් නිරෝධය හුඟක් දුරයි....

- *උන්වහන්සේ* -

# තේ එකක් තුළින් මතුකර ගතහැකි කුසල් සම්භාරය....

තේ එකක් දෙනකොට "තේ එක පිළිගැන්වූවා" කියන කුසලය විතරද තියෙන්නේ? නෑ!

තේක මම ප්‍රියමනාප සිතින් දෙනවා. ඒ ප්‍රියමනාප සිතත් දානයක්. ගරුත්වයෙන් දෙනවා. ප්‍රියමනාප වචන භාවිතා කරමින් දෙනවා. "සුභාසිතාව යාවාචා" ....තව කෙනෙකුට මෛත්‍රියෙන් දෙනවා. අත්හැරීමේ පාරමිතාව ප්‍රගුණ කරනවා. දාන පාරමිතාව ප්‍රගුණ කරනවා. මෛත්‍රියෙන් දෙන නිසා සීල පාරමිතාව ප්‍රගුණ වෙනවා.

තේ පැන් හදන සෑම මොහොතක් පාසා ඒක තුළින් ධර්මය වඩන්න පුළුවන් නම් අපට බොහොම ඉක්මනින් පාරමිතා සම්පූර්ණ කරන්න පුළුවන්.

මේ තේ එක බිව්වහම අර උපාසක මහත්මයාගේ පිපාසය සංසිඳෙනවා. සාදු සාදු! මේ තේ පැන්වල ආනිසංසයේ බලයෙන් මගේ ධර්ම පිපාසය සන්සිඳේවා! සංසාරේ නැවත ඉපදුණත් ධර්ම පිපාසය ඇති නොවන්නට මේ තේ පැන් හේතු වේවා!

මේ තේ ටික බිව්වහම අර උපාසක මහත්තයට ජීවත් වන්න අවශ්‍ය ආයුෂ ලැබෙනවා. එහෙනම් මේ තේ වලින් මම එයාගේ ප්‍රාණය රැක ගත්ත. ගමන් මහන්සිය නිවාලූවා. දුක නිව්වා. මටත් මේ දීර්ඝ සංසාරේ ඇවිදලා

මහන්සියි. මේ තේ පැන් තුළින් මම මේ මහත්මයාගේ විඩාව දුරු කළා සේ ම මගේ සසර ගමනත් විඩාවකින් තොරව නිමා කරන්න මේ කුසලය හේතු වේවා! සංසාර දුක නැමැති මහන්සියෙන් මා අතමිදේවා!

මේ තේ එක හදනකොට සීනි දාල රසකළා. එසේ සීනි දාල රසට හදල දුන්න ආනිසංසයෙන් ධර්ම රසය අත්විඳිමින්, සෑම ධර්මයක්ම මට මී පැණි වගේ රස දැනේවා! නින්දා ප්‍රශංසා මට එකලෙස මී පැණි වගේ දැනේවා! නැවත ඉපදීම නතර කරන්න අවශ්‍ය ඒ ධර්ම රසය අත්විඳිමින් නිවනින් සැනසෙන්න මට ඒ කුසලය හේතු වේවා!

සීනි දැම්ම විතරක් නෙමෙයි. සීනි අඩුවෙන් නොදා මම ලෝබ කම අතහැරලා අවශ්‍ය පමණට සීනි දැම්ම. ඒ වගේ.. මේ මාර්ගය තුළ ගමන් කරන මොහොතක් පාසා "ඇතියි ඇතියි" කියන තාක්කල් ධර්ම රසය ලබාදෙන උත්තමයන් පහළ වේවා! නැවත නොඉපදෙන්න තරම් අවශ්‍ය පමණට ධර්මය මුණගැසේවා!!

මේ තේ එක නිමෙන්න කලින් පිළිගන්වන්න ඕන. තේකේ වටිනාකම තියෙන්නේ රස්නය මත.තේක නිවුනහම රස ගුණවලින් වැඩක් නෑ වගේ මේ කමටහන් නැවුම්ව රස්නෙන්ම පුරුදු පුහුණු කරන්න මා තුළ වීර්යය වැඩේවා! එයට අදාළ ප්‍රඥාව පහළ වේවා!

මේ ආකාරයට තේ එකක් හදනකොට මොනතරම් ගුණධර්ම අපට වඩන්න පුළුවන් ද! මෙලෙස සෑම මොහොතකම සිහියෙන් ඉඳලා කර්මය තාවකාලිකව නවත්තන්න පුළුවන්. ප්‍රඥාවෙන් මේක දකින්න පුළුවන් නම් එයා ගොඩක් කුසල් සම්පත් තියෙන කෙනෙක්!!

**- උන්වහන්සේ -**

# අපූරු ගුරුවරයා

කිසිම කුටියක් නැතිව කබල් පාත්තරයක් සහ අත්‍යවශ්‍ය දේවල් කිහිපයක් එක්ක ගහක් යට බවුන් වඩන තාපසයෙක් සහ ඒ වෘක්ෂයට අධිපති දේවතාවෙක් අතර ඇතිවුන කතාබහක්...

දෙවියන් - අවසරයි.. ඔබ වහන්සේගේ ගුණ කඳ ඉමහත්. ප්‍රඥා පාරමී ඉතා ඉහළ බව දැනෙනවා. මට ඔබ වහන්සේට සලකන්න ඕන. ඔබ වහන්සේ ඉල්ලන ඕනෑම වරමක් දෙන්නම්. ඔබ වහන්සේ වැනි උත්තමයන් ඉතා ශ්‍රේෂ්ඨයි. රජකමද ඕනේ. දෙන්නම්. කහවනු ඕනෑතරම් මවල දෙන්නම්.

තාපසතුමා - මට කිසිවක් ඕනේ නෑ.

දෙවියන් - එහෙම කියන්න එපා. ඉල්ලන ඕනෑම දෙයක් දෙන්නම්.

කියන්නකෝ.

ඔබ වහන්සේගේ අප්‍රමාණ ගුණ දැකල තමයි මට ඔබ වහන්සේ ළඟට ඇවිත් මෙලෙස උවැටන් කරන්න හිතුනේ.

මේ දෙවියන්ගේ ඇවිටිල්ල නිසාම තාපසතුමා මෙලෙස පිළිතුරු දෙයි.

තාපසතුමා - හොඳයි. මෙච්චර කියනවනම් මගේ මේ දකුණු කකුලේ තියෙන තුවාලය වම් කකුලට මාරු කරල දෙන්නකෝ.

දෙවියන් - අනේ උතුමාණනි.. ඒකනම් කරන්න බෑ. කර්මානුරූපීව ඒ කකුලට තමයි තුවාලය ලැබිල තියෙන්නේ. සමාවෙන්න..

තාපසතුමා - බොහොම හොඳයි! දැන් තමයි ඔබට තේරුනේ.

කුටියක්වත් නැතුව, හරිහමන් පාත්තරයක්වත් නැතුව මේ ගහක් යටට වෙලා මේ ලෙස බවුන් වඩන්න වීම තමයි කර්මානුරූපීව මට උරුම . ඒක තේරුම් ගත්ත නම් දැන් මෙතනින් යන්න!

උපාසක - සමාවෙන්න. මට ප්‍රශ්නයක් තියෙනවා.

ඔබ වහන්සේ දෙවියන්ගෙන් ඔය කකුලේ තුවාලය අනික් කකුලට මාරු කරල දෙන්න ඉල්ලුව මිසක් සුව කරල දෙන්න කියලා ඉල්ලුවේ නැත්තේ ඇයි?

තාපසතුමා - මේ තුවාලය තමයි මගේ ගුරුවරයා. මේක තමයි මට

මාර්ගය වඩන්න මග පෙන්වන්නේ. මේ තුවාලය තමයි මට කියලා දෙන්නේ, සියලුම දේ අත්හැරියත්

මේ කයක් තියෙනවා කියලා. මේ තුවාලය තියෙන්කල් ඒක පරිස්සම් කරන්න වෙනවා. එහෙ මෙහෙ ගල්වල වැදුනොත් රිදෙනවා. දුකයි. ඉතින් මට මේ තුවාලය ආරක්ෂා කරන්න වෙනවා.

ඒ වගේ තමයි මේ ආයතන අවබෝධ නොවන තාක්කල් ඒ තුළින් හටගන්න ස්පර්ශය දුක ගෙනදෙනවා. මේක මට නිතරම මතක් කරල දෙන්නේ මේ තුවාලය.

ඒක හොඳ කරන්න කීයටවත් ඉඩ දෙන්නේ නෑ!!

- **උන්වහන්සේ** -

# වැරදුණොත් සසරේ

උන්වහන්සේ - මේ ලෝකේ හැමදේම අනිත්‍යයිද?

ශිෂ්‍යයන් වහන්සේ - ඔව්

උන්වහන්සේ - ඇයි එහෙම පිළිගත්තේ?

ශිෂ්‍යයන් වහන්සේ - මේ ලෝකේ කිසිම දෙයක් පවතින්නේ නෑ.

උන්වහන්සේ - ඒ උත්තරය ඔබ වහන්සේගේ සම්මා දිට්ඨිය පිළිබඳ ප්‍රශ්නයක්. ඒ පිළිතුරට අනුව මේ ලෝකේ කිසිම දෙයක් පවතින්නේ නෑ කියලා දැනෙන්නේ තමන් පවතින නිසා!

පවතින්නේ නැති කෙනෙකුට

පවතින්නේ නැති එකක් පේනවද?

ඒක හරියට මාළුවාගෙන් වතුර සීතලද

කියලා අහනවා වගේ වැඩක්.

පැවැත්ම තුළ නැති කෙනෙකුට නොපැවැත්ම වැටහේවිද?

මාර්ගය නිරෝධය උදෙසා වැඩුවත්, ඒ තුළ ඇහෙන, පෙනෙන, සිතෙන, දැනෙන මේ සළායතන සමඟ ගනුදෙනු කරන සංඥා සංස්කාර ධර්ම සියල්ල නිරෝධයට සාපේක්ෂව පේන්නේ නැතුව පැවැත්මකින් පේනවනම් අන්න එතනයි වැරදිලා තියෙන්නේ.

නිරෝධය සරලයි. නමුත් මේ පොඩි තැන වැරදුනොත් සසරේ තමයි!

- **උන්වහන්සේ** -

## ඔබත් බැරි දේවල් කරන්න යන කෙනෙක් ද?

තථාගතයන්
වහන්සේ - අංගුලිමාල මම නැවතිලා ඔබත් නවතින්න...

අංගුලිමාල කල්පනා කරනවා මෙච්චර හයියෙන් දුවන කෙනෙක් නවතින්නේ කොහොමද? කය දිව්වට උන්වහන්සේ දුවන්නේ නෑ කියනවනේ. ඒක එහෙම වෙන්නේ කොහොමද?

අංගුලිමාල - මමත් දුව දුව නවතින්න කැමතියි ,

බලබල නවතින්න කැමතියි, ශ්‍රවණය කරන ගමන් කතා කරකර ඉන්න ගමන් නවතින්න කැමතියි. ඒ ක්‍රමය කියලා දෙන්න...

භාග්‍යවතුන්
වහන්සේ - මේ ගහෙන් කොළයක් කඩන්න.

දැන් නැවත එය අලවන්න.

අංගුලිමාල මේ කොළේකඩා නැවත අලවන්න උත්සහ කළත් ඒක හිටින්නේ නෑ. අංගුලිමාල කැලඹෙමින් මෙසේ අසයි.

අංගුලිමාල - මේක ඇලවෙන්නේ නෑනේ..

භාග්‍යවතුන්
වහන්සේ - අලවන්න බැරිනම් ඇලවෙන්නේ නැති එකක් ගැලෙව්වේ ඇයි?

කම්පනයට පත්වූ අංගුලිමාල මේ පණිවුඩය වටහා ගන්න උත්සහ කරනවා.

භාග්‍යවතුන්
වහන්සේ - අංගුලිමාල... අලවන්න බැරි දේ ඇලෙව්වේ ඇයි? නැවත ප්‍රතිසංස්කරණය කරන්න බැරි දෙයක් කරගත්තේ ඇයි? නවත්තන්න බැරි කර්මයක් නිෂ්පාදනය කරගන්නේ ඇයි? බැලෙන එක නවත්තන්න බැරි නම් බලන්නේ ඇයි? අහෙන දෙයින් දුක නවත්තන්න බැරි නම් අහන්නේ ඇයි? හැසිරෙන දේ වලින් ඉපදීම නවත්තන්න බැරිනම් හැසිරෙන්නේ ඇයි?

අන්න එතකොට අංගුලිමාලට මේ ආයතනවල ධර්මතාව ගෝචර වුණා මේ එක වචනයක් තුළින්.

බැරි දේවල් කරන්න යන්නේ ඇයි කියලා මේ ලෝකේ අනන්ත අප්‍රමාණ ලෙස අපි අහලා තියෙනවා.මේ මොහොතේ අංගුලිමාල ඒ උතුම් අරිහත් බෝධියට සමවැදුනා.

අංගුලිමාල - මම ආයිත් කවදාවත් මට කරන්න

බැරි දේවල් කරන්න යන්නේ නෑ. ජීවිතයක් නැවත දෙන්න බෑ. ඒ නිසා කාගෙවත් ජීවිතයක් මම ගන්නේ නෑ.වේදනාව මට නැවත නැතිකරන්න බෑ. ඒ නිසා මම කාටවත් වේදනාව දෙන්නේ නෑ. දුක කාගෙවත් මට නැතිකරන්න බෑ. ඒ නිසා මම කවදාවත් කාටවත් මින්පස්සේ දුකක් දෙන්නේ නෑ!!

කරන්න බැරි දේවල් කරන්න යන්නේ නෑ!!

මේ අවබෝධයත් සමගින් අංගුලිමාල නියම අහිංසක චරිතයට නැවතත් සමවදිනවා... ලබාපු මිනිසත් බවේ වැඩ නිමාකරන්න සමත් වෙනවා...

- **උන්වහන්සේ** -

# අදින්නා දානා වේරමණී සික්ඛාපදං සමාධියාමි. කවුද ලොකුම හොරු?

ස්වාමින් වහන්සේ - අවසරයි.. මෙතන සෙරෙප්පු දෙක ගලවල තියලා ගිහින් එනකොට ඒක කවුරුහරි අරගෙන.

උන්වහන්සේ - ඔබ වහන්සේට විශ්වාසද ඒ නැතිවුනේ ඔබවහන්සේගෙම සෙරෙප්පු දෙක කියලා?

ස්වාමින් වහන්සේ - ඔව් ඒක මගේ තමයි.

උන්වහන්සේ - නිකමටවත් හිතුනේ නෑ නේද ඒ සෙරෙප්පු දෙක ඔබ වහන්සේ ගාව තියෙන කාලය ඉවර නිසයි දැන් වෙන කෙනෙක්ට අයිති වුනේ කියලා?

ස්වාමින් වහන්සේ - (බිම බලා..) එහෙමනම් හිතුනේ නෑ...

උන්වහන්සේ - මේ අපට හමුවන නාම රූප කවදාවත් කිව්වේ නෑ අයිතිවාසිකම්.. මේ මිනිස්සු තමයි ඒවා තමන්ගේ කරගෙන දුක් විඳින්නේ.

අදින්නා දානා වේරමණී සික්ඛාපදං සමාධියාමි කියන සිකපදය කොයිතරම් ගැඹුරු දෙයක් අපට පෙන්නලා දෙනවද...

මේ මහපොළව තුළ තියෙන නාමරූප අයිති මහපොළොවට. ඒක මෙතනින් අතනට ගියා කියලා ඒක අදින්නදානයක් වෙන්නේ කොහොමද?

පොළව අපිට තහන්චි දැම්මද ඉපදෙන්න එපා කියලා. අපි ඉපදිලා ජීවත් වෙන්නේ මේ මහපොළවෙනේ.. අපි තමයි මේ මායිම් වෙන්කරගෙන දුක් විඳින්නේ.

වැස්ස කවදාවත් බෙදීම් නොකර හොඳ නරක සියලුම මිනිස්සුන්ට වැස්ස දුන්න. කිසිම බේදයක් නැතිව අපි හැමෝම ඉර එළිය පාවිච්චි කරනවා. මේ ගංගා ඇළදොළවලින් ජලය ලබාගන්නවා. මේ වාතය ආස්වාස කරනවා. මේ සියල්ලම අපි තමයි අදින්නා දාන කරන්නේ.

මේ සොබා දහමට අයිති සතරමහා භූත වත් ඉන් සැකසුණු නාමරූප වලවත් නෙමෙයි මේ ප්‍රශ්නේ.

අපේ සිතිවිලි තමයි ප්‍රශ්නේ.මේ නාමරූප ඇත්ත කරගැනීමමයි හොරකම!!

එතකොට මගේ දේ අහවලා පැහැර ගත්තා, සහ මට අයිති දෙයක් මම ලබාගත්තා යන මේ චේතනා දෙක තමයි හොරකම බවට පත්වෙලා තියෙන්නේ.

ඒ නිසා ආර්ය ශ්‍රාවකයෙක් පුළුවන් තරම් උත්සහ කරනවා මේ යථාර්ථය දකින්න.

එහෙම ලෝකේ ඇත්ත දකින්න දක්ෂ ආර්ය ශ්‍රවකයෙක් අතින් කවදාවත් අදින්නා දානය වෙන්නේ නෑ වගේම වෙන කෙනෙක් තමන්ගේ දෙයක් සොරකම් කළත් ඒක සොරකමක් හැටියට දකින්නෙත් නෑ. මේ ලෝකේ හොරකම් වෙන්න විදිහක් නෑ කියලා එයා ප්‍රත්‍යක්ෂ කරන ප්‍රමාණයට එයා දුකින් මිදෙනවා!

- **උන්වහන්සේ** -

# ඇහැට පේනවද?

Doctor - ඔබ වහන්සේව මුණගැහෙන්න එන්න ආසාව තිබුණත් ලෙඩ වෙලා හිටිය නිසා එන්න බැරිවුණා. ඇඟපතේ අමාරුව දැන් තමයි ටිකක් අඩුවුනේ. අවසරයි.

උන්වහන්සේ - බොහොම හොඳයි. ඔබතුමා ඔබතුමාට පේන දේට වඩා පෙනිච්ච දේ තුළින් තමන්ට වැටහිච්ච දේ ගැන කතාකරන්න තරම් විදර්ශනාව වඩල නැතිකෙනෙක් බව දැනෙන නිසා මම මේ විදිහට කියලා දෙන්නම්.

ඇත්තටම ඇහැට පේනවද?

Doctor - වෛද්‍ය විද්‍යාවට අනුව ඇහැට තමයි පෙන්නේ. ඒක විග්‍රහ කරන්න ගියොත් ලොකු කාරණා ගොඩක්.

උන්වහන්සේ - ඒක හරි. දැන් ඇහැ ගලවලා තැටියකින් තිබ්බොත් එයාට ඇයි පෙන්නේ නැත්තේ?

Doctor - කය නෑනේ

උන්වහන්සේ - අන්ධ අයට ඇස් නෑ කය තියෙනවනේ. එතකොටත් පෙන්නේ නෑනේ. එතකොට ඇහැ සහ කය දෙකම තිබුනම පේනවද?

Doctor - ඔව් අනිවාර්යෙන් පේනවා.

උන්වහන්සේ - එතකොට මෝචරියේ කට්ටියට පේන්නේ නැත්තේ ඇයි?

Doctor - ආ.. පණ නෑනේ

උන්වහන්සේ - එතකොට ගැඩවිලාට පණ තියෙනවනේ ඇස් නෑනේ? පේනවද? නෑනේ!

Doctor - හ්ම්ම්...

උන්වහන්සේ - එතකොට ඇසත්, කයත්, සිතත් තියෙන්න ඕනලු පේන්න. ඒ තුන එතකු වුනේ නැත්නම් එයාට පේන්නේ නැහැලු. ඇත්තටම කාටද පේන්නේ? කයට නෙමෙයි සිතට!

දොස්තර මහත්තයෝ ටිකක් advance මට්ටමකට විදර්ශනාව වඩන කෙනෙක් සිතට සාපේක්ෂව තමයි කටයුතු සිද්ද වෙන්නේ කියලා තේරුම් ගන්නවා. ඔබතුමා කයෙන් ලෙඩවුනාට වඩා හිතෙන් තමයි ලෙඩවුනේ කියලා තේරුම් ගන්න පුළුවන් වෙච්ච දවසට ඒ අවබෝධයේ ප්‍රමාණයට දුක නැතිවේවි...

- **උන්වහන්සේ** -

# මුසාවාදා වේරමණී සික්ඛාපදං සමාධියාමි

මුසාවාදා වේරමණී සික්ඛාපදං සමාධියාමි කියන්නේ සෙල්ලම් ශික්ෂා පදයක් නෙමෙයි.

වැඩිහිටියන් අපිට කුඩා කාලේ ඉඳලා කියලා දීලා තියෙන්නේ බොරු කීමෙන් වළකින්න කියලා. නමුත් මේ සිකපදය ඊට එහා ගිය පරමාර්ථ සත්‍යයක් කියා සිටින්නේ.

අද අපිට පරම සත්‍යය අවබෝධ කරගන්න බැරිවෙලා තියෙන්නේ ඇයිද කියලා හොයල බැලුවොත් ඒකට හේතුව සංසාරේ පුරාවට අපි මේ ශික්ෂා පදය බිඳලා. සෑහෙන්න බොරු කියමින් ඇවිල්ල තියෙන්නේ. මේ සිකපදය ආරක්ෂා කළේ නැති නිසාම අද අපිට සත්‍යය වැහිලා ගිහිල්ල. ඇස් තියෙනවා නමුත් අන්ධයෝ වෙලා. කන් තිබිලත් බීරෝ වෙලා. සත්‍යය වැටහෙන්නේ නෑ. බොරු කීමේ හේතුව නිසා එහි ඵලයක් වශයෙන් ඇත්ත හැංගිලා. හේතුඵල දහමනේ...

අපි අද මේ දකින, අහන, හැඟෙන, දැනෙන සියල්ලම ඇත්ත කියලා හිතාගෙන රැවටිලා. සතර මහා භූත, වර්ණ, සන්ධ, රස, ඕජා සියල්ලම ඇත්ත දකින්න කියලා අපට කෑ ගහනවා. ඒත් තේරෙන්නේ නෑ. ඇයි? ඒ තරම් බොරු කියලා. පුටුවක ඉන්දවල දවසෙම

බණ කිව්වත් එයාට ඒක තේරෙන්නේ නෑ. සෑම නාම රූපයක්ම පෙන්වා දෙන පරම සත්‍යය තේරෙන්නේ කොහොමද සංසාරේ එච්චර මේ ශික්ෂා පදය බිඳලා.

උදේ ඉඳන් රෑ වෙනකල් වළඳන්නේ නාම රූප, ඇහෙන්නේ, පෙන්නේ, දැනෙන්නේ, ස්පර්ශ කරන්නේ නාම රූප. නමුත් වැඩක් නෑ. එයාට පරම සත්‍යය වැහිලා.

කොටින්ම කිව්වොත් අද අපි බොරුව ඇත්තක් කරගෙන ඒ ඇත්ත කියලා හිතාගෙන ඉන්න බොරුව තුළ බොරුවෙන් වැළකී ඉන්න බලනවා.

අන්න එහෙම වෙන්නේ අපි සංසාරේ බොරු කියපු නිසා.

ඉතින් අද මේ දැන් ඉඳලාවත් තමන්ට තමන් අවංක වෙන්න. තමන් දෙසම හැරී බලන්න... කිසිම තැනක අසාධාරණයක් වෙලා නෑ. මම කියපු බොරු නිසාම තමයි මට ඇත්ත සැඟවිලා තියෙන්නේ කියලා තේරුම් ගත්ත දවසට ඔබ ඇඟිල්ල දික්කරගන්නේ ඔබටමයි!! අන්න එතකොට ඔබටත් මේ ලෝකේ පරම සත්‍යය විවෘත වේවි!!!

- **උන්වහන්සේ** -

# මහාචාර්ය නොදත් විද්‍යාව

මහාචාර්ය
තුමා - ස්වාමින් වහන්සේ අවසරයි.. ඔබ වහන්සේව හොයාගෙන ආවේම ඉතා වැදගත් කාරණාවක් දැනගන්න.

උන්වහන්සේ - ආ.. ඉතින් ඔබතුමා තරම් දක්ෂ මහාචාර්ය කෙනෙක් මං වගේ මේ අසරණ කෙනෙක්ගෙන් මොනා දැනගන්නද. ඔබතුමා ඉතින් භූගෝල විද්‍යාව, ජීව විද්‍යාව, භෞතික විද්‍යාව ඉඳලා ඔක්කොම විද්‍යාවන්ගෙන් පරතෙරටම ගිය කෙනෙක් නේ. මම ඉතින් දන්නේ එකම එක විද්‍යාවක් විතරයි.

ඒ තමයි ගැල විද්‍යාව!

මහාචාර්ය
තුමා - ඒ කිව්වේ?

උන්වහන්සේ - ගැලවීමේ විද්‍යාව. ඒක තමයි ඔය ඔක්කොම විද්‍යාවන්ගෙන් මිදෙන්න පුළුවන් එකම ලෝකේ තියෙන වටිනාම විද්‍යාව.

මහාචාර්ය
තුමා - අනේ සාදු. මම ධර්මය අහනවා. මට අවිද්‍යාව දුරු කරන හැටි කියා දෙන්නකෝ.

උන්වහන්සේ - ඒක කවදාවත් වෙන්නේ නෑ.

මහාචාර්ය
තුමා - ඇයි ඒ? පටිච්ච සමුප්පාදයේ මුල්ම පුරුක අවිද්‍යාව නේ. ඉතින් දුරුකරන්න ඕන අවිද්‍යාව නේද?

උන්වහන්සේ - ඔබතුමාට මම මෙහෙම කිව්වොත්..

කෙනෙක් ඝන අඳුරේ ඉන්නව. අඳුරේ ඉඳන් ආලෝකය ඕන කියලා කෑ ගගහ හිටියයි කියලා අඳුර දුරුවෙනවද? නෑ නේද? එයා ආලෝකය දල්වන මොහොතක් එනවද අන්න ඒ මොහොතේ ඒ ප්‍රමාණයට ඉබේම අඳුර දුරු වෙනවා. එහෙම නැතුව බලෙන් අඳුර දුරුකන්න කවදාවත් බෑ.

ඉතින් මහත්තයෝ ඒ වගේ අවිද්‍යාව කොච්චර හිතුවත්, කිය කිය ගියත් එහෙම දුරුකරන්න බෑ. ඒ වෙනුවට කරන්න තියෙන්නේ විද්‍යාව උදා කරගන්න එක. එතකොට ඒ ප්‍රමාණයට ඉබේම අවිද්‍යාව දුරුවේවි!

චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි ආලෝකෝ උදපාදි.

- **උන්වහන්සේ** -

# බුදුහාමුදුරුවන්ට වැරදුනාද?

උන්වහන්සේ - පුංචි කාලේ ඉඳලා පන්සිල් සමාදන් වෙනවා නේද?

උපාසක - එහෙමයි

උන්වහන්සේ - මේවයේ තේරුම් දන්නවද?

උපාසක - එහෙමයි

උන්වහන්සේ - පුංචි කාලේ ඔබතුමා මත්වතුර, ගිනිවතුර වගේ දේවල් පාවිච්චි කළාද?

උපාසක - අනේ නෑ ස්වාමිනී. පුංචි කාලේ ඉතින් හරිම අහිංසකයි. ඕව ගැන දන්නෙවත් නෑනේ.

උන්වහන්සේ - එහෙනම් සුරාමේරය මජ්ජපමාදට්ඨානා වේරමණී කියන සිකපදය සමාදන් වුනේ ඇයි?

මේ අවස්ථාවෙදි උපාසක නිරුත්තරව බලා සිටියි.

උන්වහන්සේ - දැන් බලන්න මේ පුංචි දහම් පාසල් යන ළමයින්ට පවා මේ පන්සිල් පදය රකින්න කියනවා.

ගිනිවතුර, මත්වතුර ගැන මොකවත්
දන්නැති පුංචි ළමයින්ට ඒගොල්ලෝ
අතින් කවදාවත් බිඳෙන්නේ නැති
සිල් පදයක් සමාදන් කරවන්නේ
ඇයි කියලා උපාසක මහත්තයට
කවදාවත් හිතුනේ නෑ නේද?

අනේ පව් මේ පුංචි ළමයින්ට මේවා කටපාඩම් කරවනවා. ඉතින් පුංචි ළමයෙක් අතින් කවදාවත් බිඳෙන්නේ නැති සුරාමේරය මජ්ජපමාදට්ඨානා වේරමණී කියලා කියන මේ සිල් පදය බලෙන් සමාදන් කරවලා මත්වතුර නොබොන ළමයින්ට ආයිත් බොන්න එපා කියනවනේ... මේකද බුදුහාමුදුරුවෝ කිව්වේ?

බුදුහාමුදුරුවන්ට වැරදුනා වත්ද????

නෑ උපාසක මහත්තයෝ... බුදුරජාණන් වහන්සේට වැරදිලා නෙමෙයි. අපටයි අද වැරදිලා තියෙන්නේ.

බුද්ධ වචනවල ගැඹුර දකින්න තරම් අපිට ප්‍රඥාව මදි. අපි අද සියලුම දෙයින් මත්වෙලා. මත්වීම නිසා ප්‍රමාදයි. මොකටද? නිවනට...

ඉරිසියාවන්, ක්‍රෝධයෙන්, ආලයෙන් මත්වෙලා. මෝඩකමින් මත්වෙලා. ඇත්ත දකින්න බැරිවෙලා. සංස්කෘතිය, රට ජාතිය, භාෂාව, කොටින්ම කිව්වොත් බුදුදහමටත් මත්වෙලා. ගිහියන් හාමුදුරුගොල්ලන්ට මත්වෙලා. හාමුදුරුවන් ගිහියන්ට මත්වෙලා. පන්සල් ගොඩනැගිලි පිරිකර දායක පිරිස්වලට මත්වෙලා. මාන්නයෙන්, මමත්වයෙන් මත්වෙලා. ප්‍රසිද්ධියට

ප්‍රශංසාවට මත්වෙලා. මේක හරි කියලා මත්වෙලා. මේක වැරදි කියලා මත්වෙලා.

බුදුහාමුදුරුවෝ අද හිටියනම් මේවා දැකල මොනව හිතෙයිද? බුදුන් වහන්සේ ඒ මහා ප්‍රඥාවෙන් යමක් දේශනා කරන්නේ නිවන උදෙසා මිසක් එයින් තවත් සංසාරේ යන්න නෙමෙයි. ඒකයි පුංචි ළමයින්ට පවා මේ සිකපදය සමාදන් කරවන්නේ.

බුදුන් වහන්සේට කවදාවත් වැරදිලා නෑ උපාසක මහත්තයෝ. අපිටයි හැමදාම වැරදිලා තියෙන්නේ. ඒකයි මේ ඔබත් මමත් මේ විදිහට නැවත ඉපදුනේ...."

**- උන්වහන්සේ -**

# උගත්කම

උන්වහන්සේ

- පුතාගේ අනාගත බලාපොරොත්තු මොනවද?

පුතා - හොඳට ඉගෙනගෙන හොඳ කෙනෙක් වෙන්න.

උන්වහන්සේ

- අවුරුදු ගණනක් ඉගෙනගෙන හොඳ කෙනෙක් වෙනවට වඩා දැන් ඉඳන්ම හොඳ කෙනෙක් වෙන්න පුළුවන්නේ.

නරක කෙනෙක් වෙන්න තමයි ඉගෙනගන්න ඕන.

බැංකුවේ locker එක කඩන්න ඉගෙනගන්න ඕන.

මනුස්සයෙකුට පහර දෙන්න, ඒක plan කරන්න ඉගෙනගන්න ඕන.

නමුත් සමාව දෙන්න ඉගෙනගන්න ඕන නෑ.

අනුන්ගේ දේපළ අරගන්න, හොර ඔප්පු ලියන්න, මායිම් වෙන් කරන්න ඉගෙනගන්න ඕන. ඒක ලොකු subject එකක්. හැබැයි අත්හැරලා යන්න ඉගෙනගන්න දෙයක් නෑ. කාටවත් කරදරයක් නොවී පාඩුවේ ඉන්න ඉගෙනගන්න කිසිම දෙයක් නෑ.

හැමෝටම හිසරදයක් වෙන්න නම් ඉගෙනගන්න ඕන. හොර, බොරු, වංචා, දුෂ්ටකම්, කපටිකම් සියල්ල ඉගෙනගන්න වෙනවා.

මත්පැන් සැරනිසා බොන්න ඉගෙනගන්න ඕන. හැබැයි නොබී ඉන්න ඉගෙනගන්න දෙයක් නෑ.

සිල් කඩන්න, බොරු කියන්න, හොර වැඩ කරන්න, අරෙහෙ යනවා කියල වෙන තැනකට යන්න ඉගෙනගන්න ඕන.

හැබැයි ඇත්ත කියන්න ඉගෙනගන්න කිසිම දෙයක් නෑ!

කොයිතරම් සරලද!!

- **උන්වහන්සේ** -

## මෛත්‍රිය ගුණයක් ලෙස වඩනවද?

ද්වේෂයක් ආපු වෙලාවට ඒක මැඩලන්න අපිට ක්‍රමයක් නෑනේ. ඉතින් අපි මෛත්‍රී තමයි කරන්නේ. මෛත්‍රී කරල ඒ ද්වේෂය මැඩලනවා.

හැබැයි මෛත්‍රී භාවනාව කෙරුවොත් ද්වේෂය මෙල්ල වෙනවා කියලා බුදුහාමුදුරුවෝ දේශනා කළාට නිරෝධවෙන කතාවක් කියලා නෑ.

ඇයි ඒ?

මම වැඩට ගෙනාපු බත් එක වෙන කෙනෙක් අරන් කාලා. මාරවැඩේ. මගේ බත් එකනේ. මට දැන් පුදුම තරහයි.

එතකොට මම "කමක් නෑ. මනුස්සයෙක් බඩගින්නටනේ කෑවේ. සුවපත් වේවා. සුවපත් වේවා. ඒ අසත්පුරුෂයා කෑවට කමක් නෑ. සුවපත් වේවා!" කියමින් මෙල්ල කරනවා. එතකොට අර ද්වේෂය මෙල්ල වෙනවා. ඒකේ ප්‍රතිඵලයක් වශයෙන් මම ඒ මනුස්සය එක්ක දබර වෙන්න යන්නේ නෑ.

ද්වේෂයක් හටගත්තොත් මෛත්‍රී කරල ද්වේෂය මෙල්ල කරන එක වටිනවා. හැබැයි යථාභූත ඥානයෙන් විතරයි ද්වේෂය නිරෝධ වෙන්නේ.

ඒ කොහොමද?

"මේ බත් එක මම නොකා ළඟ තියාගෙන හිටියත් හෙට උදේ වෙනකොට පිළුණු වෙලා වීසි කරනවා. උදේ ගෙනාපු බත් එක හවස් වෙනකොට තෙත් වෙනවා. ගඳ ගහනවා. ඊට පහුවෙනිදා කෑම පෙට්ටියත් ගඳයි. විසික් කරනවා. එහෙනම් එයා කෑවත් මම කෑවත් තව පැය තුනක් ඇතුළත කනඑක තමයි කරන්න ඕන. විසික්කරන්න කලින් කාගේහරි කුසගිනි නිවන්න පුළුවන් වුණා. ඒක ලොකු පිනක්!!"

ඒක තමයි යථාභූත ඥානය.

එතකොට ද්වේෂය නිරෝධ වෙලා යනවා.

නිතරම කෙලෙස්වලට යථාභූත ඥානය තුළින් පහර දෙන්නයි දක්ෂ වෙන්න ඕන. ගුණයකින් මෙල්ල කරනවට වඩා. මෛත්‍රී නැමැති ගුණය වඩනකොට ද්වේෂය මෙල්ල වෙනවා. නමුත් ද්වේෂය නිරෝධ වෙන්නේ යථාභූත ඤාණයෙන් පමණයි!

- **උන්වහන්සේ** -

## සැලකිය යුතුයි !

නිවෙන තැන් සොය සොයා යාමට වඩා ඇවිළෙන තැන් සොයා නිවන්න.
සියල්ලන්ගේ උත්සහය ඔබේ නිවීමය.
ඇවිළෙන්නේ ඔබමය.

ඇවිළෙන තැන් නිවීමෙන් නිවීම හටගන්නවා මිස,
නිවුනු තැනින් නිවීම ගන්නට දරන උත්සහය සුළං ඇල්ලීමට කරන වෑයමක් වැනිය.

ඔබේ නිවීම ඔබේම වගකීමයි
එය පැහැර නොහරින්න !!!

සඟ උපදෙස් ලබා බුදුන් සරණ යන්න !
මෙයට තථාගත ශ්‍රාවක සංඝ

# පසුවදන

නිවීම සොයන්නේ නිවීම තෙරුම්ගත් නිසාද ?,
පැවැත්ම ඔරොත්තු නොදෙන නිසාද ?
මෙය සිතා බැලුවාද?

නිවෙනවා නම් ඕනම දෙයක් අල්ලගන්න !
ඇවිළෙනවා නම් රත්‍රන් උවත් විසිකරන්න !

සලායතනවල ගනුදෙනු නිවෙන ලෙස භාවිතා කරන්න. සතර ඉරියව්වෙන් පුරුදු කරන්න.

ඔබේ නිවීම අපගේ ප්‍රාර්ථනාව නොව එය ඔබේ අවශ්‍යතාවයය !!!

ලෝකය පවතින්නේ බොරුව මතය. ඔබ එම බොරුවේ මුරකාරයාය. දිනපතා එම බොරුව නඩත්තු කරන්නේය. සියල්ලට අසු වී ඇති බවට සාක්ෂිය එයයි.

"නිවන් දකිමු ස්වාමින් වහන්සේට අසු වන්නේද? එයත් නැවත ඉපදීමට හේතුවකි" !!!

